රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 30/2013

මගේ අංකය : EST 5/4/1/13 (XI) – Vol I
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2013.12.18

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වූ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පංතියේ හා අධි පංතියේ නිලධරයන්ගේ වැටුප් විෂමතා ඉවත් කිරීම**

සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වැනි පංතියේ සහ අධි පංතියේ නිලධරයන් 2009.10.15 දින සිට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ දී, සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පංතිය හා අධි පංතියේ නිලධරයන් හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I වන පංතිය හා අධි පන්තියේ නිලධරයන් අතර ඇති වැටුප් විෂමතාව ඉවත් කිරීමට 2013.07.04 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02) ඒ අනුව 2009.10.15 දිනට පෙර සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ සිටි I පංතියේ සහ අධි පන්තියේ නිලධරයන්ගේ වැටුප් විෂමතාව නිදොස් කිරීම සඳහා පමණක් පහත සඳහන් පරිදි කල්පිතව ඔවුන්ගේ වැටුප් පරිවර්තන සකස් කළ යුතුය.

(i) රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට 2009.10.15 දින සිට අන්තර්ග්‍රහණය වූ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I පංතියේ හා අධි පංතියේ නිලධරයන්, වැටුප් විෂමතාව ඉවත් කිරීමේ කාර්ය සඳහා පමණක් 2003.05.01 දින සිට ක්‍රියාත්මක වූ සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයට අයත් නිලධරයන් ලෙස නොසැලකීම.

(ii) ඉහත (i) හි සඳහන් නිලධරයන්, රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය පිහිට වූ 2004.01.01 දින සිටම රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අන්තර්ග්‍රහණය වූ නිලධරයන් ලෙස හා රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට අදාල වැටුප් ක්‍රම අනුව උසස්වීම් ලබාදී ඇති බව සැලකීම හා ඒ අනුව සියලු වැටුප් පරිවර්තන සකස් කිරීම.

03) ඉහත 02) හි සඳහන් කරුණු, වැටුප් පරිවර්තනය කිරීමේ කාර්ය සඳහා පමණක් අදාල කර ගත යුතු අතර, එකී කාර්යය හැර අනෙක් සියලු කාර්යය සඳහා මෙම නිලධරයන් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයට සත්‍ය වශයෙන් අන්තර්ග්‍රහණය වූ දිනය අදාල කර ගත යුතුය.

04) ඉහත 02) පරිදි වැටුප් සංශෝධන කිරීමෙන් පසු හිඟ වැටුප් ගෙවීමකින් තොරව 2013.07.01 දින සිට සංශෝධිත වැටුප ගෙවිය යුතුය.

05) මෙකී චක්‍රලේඛයේ විධිවිධානවලට යටත්ව 2013.07.01 දිනට පෙර විශ්‍රාම ලබා ඇති නිලධරයන් සඳහා ද හිඟ වැටුප් ගෙවීමකින් තොරව, 2013.07.01 දින සිට සංශෝධිත විශ්‍රාම වැටුප ගෙවිය යුතුය.

06) මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ හා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ එකඟතාව මත නිකුත් කරනු ලැබේ.



පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය